සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka
NEW
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ජෛවපද්ධති තාක්ෂණවේදය II
உயிர்முறைமைகள் தொழினுட்பவியல் II
Biosystems Technology II

66 S II

## B කොටස - රචනා

**උපදෙස් :**

* ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
* එක් ප්‍රශ්නයකට ලකුණු **100** බැගින් හිමි වේ.
* අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.
* **වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර ලබා දෙනු ලැබේ.**

**5.** (*a*) ශාක අතු බැඳීමේ විවිධ ක්‍රම විස්තර කරන්න.

(*b*) ගැලීම් සටහනක් භාවිතයෙන් හරිත තේ (green tea) නිෂ්පාදනයේ පියවර පැහැදිලි කරන්න.

(*c*) ජල සම්පාදන කටයුතු සඳහා ජල පොම්පයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු විස්තර කරන්න.

**6.** (*a*) ජෛවපද්ධති කෙරෙහි පාංශු වයනය හා පාංශු ව්‍යූහය වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න.

(*b*) මත්ස්‍ය පොකුණක් තුළ ඇති කරනු ලබන ආහාරමය මසුන් සඳහා ආහාර සැපයීමේ දී සැලකිය යුතු කරුණු විස්තර කරන්න.

(*c*) දැව සංරක්ෂණය කිරීමේ විවිධ ක්‍රම විස්තර කරන්න.

**7.** (*a*) බ්‍රොයිලර් කුකුළු මස් සැකසීමේ ක්‍රියාවලියේ වැදගත් පියවර, එම එක් එක් පියවර ක්‍රියාත්මක කිරීමේ අරමුණ සඳහන් කරමින් පැහැදිලි කරන්න.

(*b*) පොලිතින් උමගක් තුළ බෝග වගා කිරීමේ ප්‍රධාන බාධක විස්තර කරන්න.

(*c*) යම් පුද්ගලයකුට මස් සැකසුම් කර්මාන්තයක් ආරම්භ කිරීමට අවශ්‍ය නම්, ඔහුගේ/ඇයගේ ව්‍යාපාරයට අදාළ ප්‍රධාන උපකාරක සේවාවන් ඒවායේ වැදගත්කම සමග සඳහන් කරන්න.

**8.** (*a*) ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාව සඳහා ආහාරයට ගත හැකි බෝගවලින් නිර්මිත භූමි අලංකරණයේ වැදගත්කම පැහැදිලි කරන්න.

(*b*) සාම්ප්‍රදායික ආහාර පරිරක්ෂණ ක්‍රමවල ඇති ආහාර පරිරක්ෂණ මූලධර්ම විස්තර කරන්න.

(*c*) එක්තරා පුද්ගලයකු, 1800 W ක ක්ෂමතාවයක් සහිත විදුලි කේතලයක් මිල දී ගත්තේ ය. එය වෝල්ටීයතාව 230 V වන ප්‍රධාන ජව මූලිකයට සම්බන්ධ කර ඇත.

(i) කේතලයේ දඟරය තුළින් ගලන ධාරාව ගණනය කරන්න.

(ii) ජලයෙන් පුරවන ලද කේතලය, පේනුවට සම්බන්ධ කර ක්‍රියාත්මක කළ විට මිනිත්තු 2 ක් උණුසුම් වීමෙන් පසුව පරිපථයේ විලායකය (Fuse) විලින විය. ඔහු පරිපථය පරීක්ෂා කළ විට එහි කිසිදු දෝෂයක් සොයාගත නොහැකි වූ නමුත් විලින වූ විලායකයේ ප්‍රමාණනය කළ අගය (rating) 5 A ලෙස සඳහන් වී ඇති බව ඔහු දුටුවේ ය.

(1) මිනිත්තු 2ක කාලය තුළ කේතලය විසින් වැය කරන ලද මුළු ශක්ති ප්‍රමාණය ගණනය කරන්න.

(2) විලායකය විලින වීමට හේතුව කුමක් විය හැකි ද?

(3) ඔහු ළඟ 1 A , 5 A , 10 A සහ 13 A ප්‍රමාණනය කළ අගයන් (rating) සහිත විලායක තිබේ නම්, ඒ අතුරෙන් මෙම පරිපථය සඳහා වඩාත් සුදුසු විලායකය කුමක් ද?

(4) ඉහත විලායකය තෝරා ගැනීමට හේතුව කුමක් ද?

**9.** (*a*) භූ දර්ශන නිර්මාණයේ දී මෘදු භූ දර්ශන අංගවල වැදගත්කම විස්තර කරන්න.

(*b*) බිම් මැනුමේ දී ස්වයංක්‍රීය ලෙවලය (auto level) භාවිත කිරීමේ ක්‍රියා පටිපාටිය විස්තර කරන්න.

(*c*) නව ආහාර නිෂ්පාදනයක් පිළිබඳ ඉන්ද්‍රීය ගෝචරතාව සොයා ගැනීම සඳහා භාවිත කරන විවිධ පරීක්ෂණ විස්තර කරන්න.

**10.** (*a*) ස්ථානීය **නොවන** ජල දූෂණය අවම කරන ආකාරය විස්තර කරන්න.

(*b*) බිම් සැකසීමේ දී භාවිත කරන විවිධ ආකාරයේ පෝරු විස්තර කරන්න.

(*c*) පාලන පද්ධතියක සංවේදක සහ ඔදයනවල කාර්යභාරය විස්තර කරන්න.

* * *